| | |
|---|---|
| | **ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය**<br>(අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා සභාවට අනුබද්ධිතයි)<br>**இலங்கை பாடசாலைகள் சதுரங்க சங்கம்**<br>(இலங்கை பாடசாலைகள் விளையாட்டு சபையுடன் இணைக்கப்பட்டுள்ளது)<br>**SRI LANKA SCHOOLS' CHESS ASSOCIATION**<br>(Affiliated to Schools Sports Council, Ministry of Education, Sri Lanka) |

| **PRESIDENT:** | **SECRETARY:** | **TREASURER:** |
|---|---|---|
| K.H.Ranjith Thilakaratne<br>G/Saint Aloysius College,<br>Galle<br>**Mob:0771187417**<br>ranjittthilakaratne@gmail.com | L.R.M.Hemantha Rathnayake<br>R/Kalawana National School,<br>Kalawana<br>**Mob:0717301788** hemanthachess@gmail.com | M.F. Priyanthi Cooray<br>Nu/Our Lady's School,<br>Nuwara Eliya<br>**Mob:0714924923**<br>Priyanthicooray1@gmail.com |


2017.05.06

විදුහල්පති තුමා/තුමිය
...............................................
...............................................

<u>2017 කේවල චෙස් තරගාවලිය ..................................... දිස්ත්‍රික්කය</u>

ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය මගින් පවත්වනු ලබන 2017 ....................................... දිස්ත්‍රික් කේවල චෙස් තරගාවලිය 15න් 17න් හා 20න් පහළ බාලක බාලිකා වශයෙන් පැවැත්වේ.ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.එම ක්‍රීඩා ඉසව්ව සංවිධානය කොට පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017 මාර්තු 17 දිනැති අංක ED/9/15/ 2 / 3 / 3 /7 ලිපියෙන් අනුමැතිය ලැබී ඇත.

වයස ගණනය කරනු ලබන්නේ 2017.01.01 දිනටය.

- අවුරුදු 15 න් පහළ 2002 - 2003 උපන් අය
- අවුරුදු 17 න් පහළ 2000 - 2001 උපන් අය
- අවුරුදු 20 න් පහළ 1997 1998 සහ 1999 උපන් අය

2. ජාත්‍යන්තර චෙස් සමුළුවේ FIDE සහ ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමයේ නීති රීති යටතේ දිස්ත්‍රික් තරග වට 05 ක් පැවැත්වෙන අතර එක් තරග වටයක් පැය තුනකි (3) කි. සම තත්වය බිඳිනු ලබන්නේ පහත සඳහන් අනුපිළිවෙලටයි.

- Direct Encounter
- Buchholz Cut 1
- Buchholz Cut 2
- FIDE (Progressive score)

<u>තරග කාල සටහන</u>

| වටය | දිනය | වේලාව |
|---|---|---|
| 1 | 2017.05. .......... | ............... සිට ............ දක්වා |
| 2 | 2017.05. .......... | ............... සිට ............ දක්වා |
| 3 | 2017.05. .......... | ............... සිට ............ දක්වා |
| 4 | 2017.05. .......... | ............... සිට ............ දක්වා |
| 5 | 2017.05. .......... | ............... සිට ............ දක්වා |

3.මේ සමඟ එවා ඇති අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී උප්පැන්න සහතිකයේ පරිදි නම <u>ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්</u> ලිවිය යුතු අතර සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළයුතු ය. එයට අමතරව,

- 15 න් පහළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා තැපැල් හැඳුනුම්පත ද
- 17 න් පහළ හා 20 න් පහළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ජාතික හැඳුනුම්පත ද ලියාපදිංචි වන අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

එක් ක්‍රීඩකයෙකු සඳහා තරග ගාස්තුව රු. 350 ක් බැගින් වේ.

4. ඔබ පාසල 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමයේ ලියාපදිංචි වීම අනිවාර්ය වේ.
රජයේ පාසලකින් රු. 700/= ක් ද
ජාත්‍යන්තර පාසලකින් රු.1500/= (එක්දහස් පන්සීයක්)ද
ගෙවා ලියාපදිංචි වන පාසල්වලට පමණක් ක්‍රීඩකයන් ඉදිරිපත් කිරීමට හැකි ය.
චෙක්පත් 'ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය' නමට ලිවිය යුතුය.

**පාසල් ලියා පදංචි ගාස්තු හා තරග ගාස්තු වෙන වෙනම ගෙවීම් ලෙස ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමයේ - මහජන බැංකුවේ 086100130014267 අංක දරණ තිඹිරිගස්යාය ශාඛාවේ ගිණුමට විය යුතුය.**

5. ................................ දිස්ත්‍රික් චෙස් තරගාවලිය සඳහා ලියාපදිංචි වීම 2017.05. ........... දින ප.ව .............. ට .......................................................... විද්‍යාලයේ දී පැවැත්වෙන බැවින් නිවැරදිව සම්පූර්ණ කළ අයදුම්පත් , උප්පැන්න සහතික හා හැඳුනුම්පත් සමග පැමිණ තරග ගාස්තු ගෙවා ලියාපදිංචි විය යුතුය.

6. අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී අන්තර්ජාතික ඇගයීමක් (International Rating) ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තොරතුරු අයදුම්පතේ ඇතුලත් කොට විදුහල්පතිතුමා විසින් සහතික කර තිබිය යුතු අතර Rating 1500 හෝ ඊට වැඩි ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිස්ත්‍රික් තේරීම් තරගය සඳහා තරග ගාස්තු ගෙවීම හෝ ඉදිරිපත් වීම අවශ්‍ය නොවන අතර කෙලින්ම සමස්ත ලංකා අවසන් තරගාවලියට අදාල තරග ගාස්තු ගෙවා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

7. දිස්ත්‍රික් තේරීම් තරගාවලියේ දී එක් තරග ඉසව්වකින් ක්‍රීඩකයින් 42ක් හෝ ඊට වැඩිවන අවස්ථා වලදී 1,2,3 ස්ථාන සඳහා ජයග්‍රාහී සහතික ද 4 සිට 21 ස්ථාන සඳහා කුසලතා සහතික ද පිරිනැමේ. ඉතිරි ක්‍රීඩකයින්ට සහභාගීත්ව සහතික ද 42ට අඩු වූ විට පිරිනමනු ලබන කුසලතා සහතික සංඛ්‍යාව ද ඊට සමානුපාතිකව අඩුකෙරේ.

   **උදා :-** සහභාගීත්වය 20 නම් පිරිනමනු ලබන්නේ 1,2,3 ස්ථාන සහ 4 සිට 10 දක්වා කුසලතා සහ 11 සිට 20 දක්වා සහභාගීත්ව සහතික ලෙසය.

   දිස්ත්‍රික් තේරීම් තරග වලදී ක්‍රීඩාකර 1,2,3 ස්ථාන ලබාගන්නා අය අවසන් තරග සඳහා සුදුසුකම් ලබන අතර සහභාගීත්වය 6 ට වැඩිවන සෑම 6 දෙනෙකුටම එක් අයෙකු බැගින් තෝරාගනු ලැබේ.

   ක්‍රීඩකයින් 01 සිට 06 දෙනෙකුට 03 ක් ද
   ක්‍රීඩකයින් 07 සිට 12 දෙනෙකුට 04 ක් ද
   ක්‍රීඩකයින් 13 සිට 18 දෙනෙකුට 05 ක් ද
   ක්‍රීඩකයින් 19 සිට 24 දෙනෙකුට 06 ක් ද
   ක්‍රීඩකයින් 25 සිට 30 දෙනෙකුට 07 ක් ද වශයෙනි.

8. පාසලේ ක්‍රීඩකයින් භාරව ගුරුමහතෙකු හෝ ගුරුමහත්මියක් පැමිණීම අනිවාර්ය වන අතර යම් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක්කේ එම ගුරුභවතාට ලිඛිතව පමණි.

9. සෑම ක්‍රීඩකයෙකුම පාසල් නිල ඇඳුමෙන් ක්‍රීඩා කළ යුතුය.

10. 2017 ..................................දිස්ත්‍රික් කේවල චෙස් තරගාවලිය 2017 මැයි මස .......................... දිනවල .......................................................... විද්‍යාලයේදී පැවැත්වෙන අතර 2017 ........... මස ................. පෙ.ව / ප.ව ................................ වනවිට සියළුම තරගකරුවන් තරග පවත්වන ස්ථානයට වාර්තා කළ යුතුය. එදින කිසිදු තරග කරුවෙකු ලියාපදිංචි නොකරන බවත් නියමිත වේලාවට තරග ආරම්භ කරන බව වැඩිදුරටත් දන්වා සිටිමු.

11. අවසන් උළෙල සඳහා තේරෙන තරගකරුවන් ඊට අදාළ තරග ගාස්තුව වන රු.500/= (රුපියල් පන්සීයක්) සංගමයේ බැංකු ගිණුමට ගෙවා අදාල රිසිට්පත ........................................ දින හෝ ඊට පෙර දිස්ත්‍රික් සංවිධායක වෙත ඉදිරිපත්කළ යුතුය.

12. අවසන් තරගාවළී 2017.06 10 සහ 11 දිනවල ගාල්ල ශාන්ත ඇලෝෂියස් විදුහලේදී පැවැත්වේ.

- **තරග පවත්වන ස්ථානයේ හා පාසල් පරිශ්‍රයේ සුරක්ෂිතබව හා භෞතික සම්පත් ආරක්ෂා කිරීම සෑම ක්‍රීඩකයෙකුගේම යුතුකමක් හා වගකීමක් වන බැවින් දෙමාපියන් පැමිණෙන්නේ නම් පාසලේ පවතින නීති රීති වලට ගරුකිරීමත් සුදුසු ඇඳුමකින් සැරසී පැමිණිය යුතු බවටත් දෙමව්පියන් හා දරුවන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමු.**
- සියලු තොරතුරු පිළිබඳ විමසීම් දිස්ත්‍රික් සංවිධායක ............................................ දුරකථන අංක ..........................................

| | | |
|---|---|---|
| ...................................... | ......................................... | ................................ |
| ගරු ලේකම් | ගරු සභාපති | දිස්ත්‍රික්/පළාත් සංවිධායක |
| L.R.M.H.D.රත්නායක | K.H.රන්ජිත් තිලකරත්න | ................................................ |
| ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය | ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය | ................................................ |
| ර/කලවාන ජාතික පාසල | විදුහල්පති (අධ්‍යාපන පරිපාලන සේවය 111) | ............................................. |
| රත්නපුර | ගා/ශාන්ත ඇලෝෂියස් විද්‍යාලය | |
| | ගාල්ල | |